**ගුරුවරුන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල**

--------------------------------------------------------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ගුරුවරුන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්</u>

#### 1.2.1 <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත</u>

ප්‍රමිත 10 ප්‍රකාර සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමට ගැලපිය යුතු ඉකුත් වර්ෂයට අදාල රු.3,484,859 ක් වූ පොලී ආදායම් ලැබීම් හා බදු ගැලපීමක් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

#### 1.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පළාත් 04 කට අදාලව සමාලෝචිත වර්ෂයේ සිදුකළ නියැදි පරීක්ෂණයේදී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු බැර නිවේදන අනුව රු.4,414,749 ක් අරමුදලට බැර වී තිබුණද විගණනයට ඉදිරිපත්කළ අවකරණ ලේඛන අනුව එම පළාත් 04 න් රු.6,145,940 ක දායක මුදල් ගුරුවරුන්ගෙන් අයකර තිබුණි. එහෙයින් රු.1,731,191 ක් ගිණුම්වල අඩුවෙන් දැක්වුණි.

#### 1.2.3 <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>

භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව, සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මස දායක මුදල් ලැබීම රු.4,373,853 ක් වුවද අධ්‍යාපන අමාත්‍යාංශයෙන් එවා තිබූ බැර නිවේදනය අනුව එම අගය රු.4,602,367 ක් වූයෙන් රු.228,514 ක නොසැසඳීමක් අනාවරණය විය.

#### 1.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | සමාලෝචිත වර්ෂයේ සාමාජික දායක මුදල | 65,649,234 | කලාප අධ්‍යාපන කාර්යාල වලින් ගෙන්වා ගත යුතු අවකරණ ලේඛන. |
| (ආ) | සාමාජික දායක මුදල් ආපසු ගෙවීම | 4,022,715 | අවකරණ ලේඛන හා ලැබීම් වාර්තා කළ පොත් පත්. |
| (ඇ) | දායක මුදල් ලැබීම - 2011 දෙසැම්බර් මාසය | 5,482,399 | අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලද බැර නිවේදනය හෝ කලාප කාර්යාල වලින් ගෙන්වාගත් අවකරණ ලේඛන. |

### 1.2.5 <u>නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ 5 හා 9 වගන්ති අනුව සම්පාදිත නියෝග අංක 9 (අ) | උක්ත නියෝගයට අනුව අරමුදල විසින් පවත්වා ගතයුතු ලේඛන කිසිවක් පවත්වා නොතිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් / 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | |
| | (1) 02 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල සමාලෝචනය කර නිරීක්ෂණ ඇතුලත් වාර්තාවක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ලබාදී නොතිබුණි. එහෙයින් මෙම අරමුදල තව දුරටත් පවත්වා ගෙන යා යුතුද යන්න නිගමනයකට එළඹීමට මුදල් අමාත්‍යාංශය අපොහොසත්ව තිබුණි. |

(11) 04.1 ඡේදය — ඡේදය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනය විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කර නොතිබුණි.

(111) 04.3 (ඊ) ඡේදය — සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අරමුදලේ බැරට ඇති ශේෂය භාණ්ඩාගාර පොත් සමඟ සැසඳූ බවට සහතිකයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සාමලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු.95,550,961 ක අතිරික්තයක් වූ අතර , ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.74,633,090 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 20,917,871 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය 28 % කින් වර්ධනය වී තිබුණි. කෙසේවෙතත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු.1,348,754 කින් එනම් 3.5% කින් පහල යාම හා දායක මුදල් ආපසු ගෙවීම් රු.623,514 කින් එනම් 18.3% කින් ඉහල යාම සිදුවී තිබුණි. එසේම දායක මුදල් ලැබීම්ද රු.19,132,699 කින් එනම් 34 % කින් ඉහළගොස් තිබුණු අතර මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් ඉවහල් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ගුරුවරුන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කරන අරමුදලට දායකවී ඇති ගුරුවරුන් පිළිබඳ විස්තර හෝ පෞද්ගලික පාසැල් හා පිරිවෙන් පිළිබඳ විස්තර හෝ ඇතුලත් ලේඛන පවත්වා ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) මාසික සාමාජික දායක මුදල් ලැබීම් රුපියල් මිලියන 4.3 සිට රුපියල් මිලියන 7 අතර පරාසයක පැවතුන අතර එක් එක් මාසයන්හි දායක මුදල් ලැබීම්වල උච්චාවචනයන් දක්නට ලැබුණි. මාසිකව ලැබිය යුතු දායක මුදල කොපමණද යන්න ගණනය කිරීමේ ක්‍රමවේදයක්

අරමුදල සතුව නොතිබුණි. එහෙයින් මුදලින් ලැබෙන දායක මුදල පමණක් වර්ෂයේ දායක මුදල ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී රුපියල් මිලියන 16 ක පොලී ආදායමක් අරමුදලට ලැබී තිබුණ ද එම මුදලින් අරමුදලේ විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි. නමුත් මෙම මුදලින් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම නොමැති දායකයින්ගේ දායක මුදල් ආපසු ගෙවීම සඳහා රු.4,022,715 ක් පමණක් වැයකර ඉතිරි රු.12,147,088 ක්වූ මුළු මුදලම ආයෝජනය කර තිබුණි.සියලුම විශ්‍රාම වැටුප් ගෙවීම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂයෙන් සිදුකර තිබුණි.

(ඈ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ගෙවීම් වාර්තා අනුව, 2011 ජනවාරි 01 දිනට, 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදලින් විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභීන් 796 ක් සිටින බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය තුල ඔවුන් වෙත ගෙවා ඇති විශ්‍රාම වැටුප් පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාමට අරමුදල කටයුතුකර නොතිබුණි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මාසික විශ්‍රාම වැටුප් වර්ගීකරණය අනුව අරමුදලේ විශ්‍රාම වැටුප් ලෙස මසකට රු.1,005,765 ක් පමණ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ගෙවා තිබුණි.

(ඉ) භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතින් පනවා ඇති නියෝග සුදුසු පරිදි සංශෝධනය කිරීම සඳහා අරමුදල පියවර ගෙන නොතිබුණි.

(ඊ) අරමුදල සතු අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී භාණ්ඩාගාරය අනුමතකර ඇති ආයෝජන මූලාශ්‍ර වන ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බැඳුම්කරවල අපේක්ෂිත ප්‍රතිලාභ ඇගයීමෙන් අරමුදලට වාසිදායී ආයෝජන කුමක්ද යන්න තීරණය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.116,347,993 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. ඒ අනුව අරමුදලට ඉහළ පොලී ආදායමක් උපයාගැනීමේ අවස්ථා සීමාවී තිබුණි.

## 4. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය.

(ආ) අවකරණ ලේඛන පවත්වාගෙන යාම.

(ඇ) ආයෝජන.